# 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම

## ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී (B.Sc.) ගෞරව උපාධිය

## ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී (B.Sc.) ගෞරව උපාධිය

**මාධ්‍යය - ඉංග්‍රීසි**

ඉහත සඳහන් උපාධි වැඩසටහන් අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයන් තෝරාගැනීම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය - 2021 සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. දැනට රටෙහි පවත්නා කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන්, අදාළ 2020/2021 අභියෝග්‍යතා පරීක්ෂණය **ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කැලණිය විශ්වවිද්‍යාලය හා යාපනය විශ්වවිද්‍යාලය** යන විශ්වවිද්‍යාල සමග සහයෝගීතාවයෙන් මාර්ගගත පරීක්ෂණයක් (online) ලෙස පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ඉහත සඳහන් ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධිය හා ශාරීරික විද්‍යාවේදී ගෞරව උපාධිය යන උපාධි දෙකම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන් සබරගමුව විශ්වවිද්‍යාලය වෙත අයදුම් කළ යුතුය.

ඉහත සඳහන් ශාරීරික අධ්‍යාපන විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා පමණක් අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන්, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය හෝ යාපනය විශ්වවිද්‍යාලය වෙත අයදුම් කළ යුතුය.

ඉහත සඳහන් ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ විද්‍යාවේදී උපාධිය සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා පමණක් අයදුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවන්, සබරගමුව විශ්වවිද්‍යාලය හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය හෝ කැලණිය විශ්වවිද්‍යාලය වෙත අයදුම් කළ යුතුය.

මෙම ප්‍රමුඛතාව, අයදුම්කරුවන් තෝරාගත් විශ්වවිද්‍යාලය සඳහා බලපාන්නේ නැත.

අයදුම්පත් ක්‍රියාපටිපාටිය, අවශ්‍ය ලේඛන හා වෙනත් අදාළ තොරතුරු ඇතුළත් විස්තර සඳහා www.sab.ac.lk වෙබ් අඩවිය වෙත යොමු වන්න.

අයදුම්කරුවන්හට අදාළ උපාධි වැඩසටහන් දෙකම සඳහා අයදුම් කළ හැක. කෙසේ වෙතත්, අයදුම්කරුවන් විසින්, එක් මාර්ගගත අයදුම්පත්‍රයක් පමණක් සමග අදාළ ලේඛනවල ස්කෑන් කළ පිටපත් අමුණා ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කෙරේ.

අයදුම්කරුවන් විසින් තමන්ගේ **මාර්ගගත අයදුම්පත, ලබාදී ඇති ලින්ක් සබඳතාවය** මගින් ඉදිරිපත් කළ යුතු අතර, රුපියල් 1,000 ක මුදලක්, **"ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය"** නමට, **ලංකා බැංකුවේ** පවත්නා ගිණුම් අංක 0002246976 වෙත ගෙවා ලබාගත් අදාළ බැංකු ගෙවුම් පතේ (කොළ පැහැ පත හෝ මාර්ගගත පත) ස්කෑන් කළ පිටපතක් උඩුගත (Upload) කළ යුතුය.

මාර්ගගත අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය, **2021 ජූනි 10 වන දින** වේ.

| **පරීක්ෂණය** | **අරමුණ** |
|---|---|
| සිද්ධාන්ත පරීක්ෂණය | අයදුම්කරුගේ ක්‍රීඩා විද්‍යා හා කළමනාකරණ සහ ශාරීරික අධ්‍යාපනයට අදාළ දැනුම අගැයුම් කිරීම. |
| ප්‍රායෝගික පරීක්ෂණය | අයදුම්කරුගේ ශාරීරික යෝග්‍යතාව අගැයුම් කිරීම. |
| ක්‍රීඩා ජයග්‍රහණ | අයදුම්කරුවන් විසින්, පසුගිය වසර පහ තුළ (2016-2020) හිමි කරගත් ඉහළම ක්‍රීඩා ජයග්‍රහණවලට අදාළ සහතිකවල ස්කෑන් කළ පිටපත් අයදුම්පත සමග උඩුගත කළ යුතුය. (විස්තර අයදුම්පතෙහි සඳහන්ව ඇත) |

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය,**
**බෙලිහුල්ඔය.**

**ඇමතුම් :**
**ෂර්මිලන් : 0760680732**
**උදය : 0719576779**